උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

--------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 07 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ගබඩා තොග ගිණුමේ ශේෂය රු.60,226 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ආ) සභාව තුළ ආදායම්, මූල්‍ය හා තොග කළමනාකරණ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා රු.1,309,857 ක් වැයකර තිබුණද එම වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සභාව සතු රු.65,000 ක් වටිනා ජල පොම්පය සහ රු.18,500 ක් වටිනා ඉනිමඟ සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර හා උපකරණ ගිණුම සහ ගබඩා ඉතිරි තොග ගිණුම යන ගිණුම් දෙකෙහිම ඇතුලත් වී තිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 04 කට අදාල උපලේඛනවල ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සමඟ සැසඳීමේදී රු.1,046,805 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.40,617,812 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන විගණිත දිනය වූ 2016 ජූලි 07 දින වන විටත් රු.18,066,682 ක් අයකර ගැනීමට තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.7,245,361 ක් වූ අතර වසර 04 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂවල වටිනාකම රු.775,375 ක් වී තිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

එකතුව රු.5,045,219 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාල විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් නොවීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි වුණි.

### 1.3.5 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

1987අංක 15දරන ප්‍රාදේශීය සභා පනතේ 154) 1 (වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවක සීමාවන් ඇතුලත වූ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට 01ක් ප්‍රාදේශීය සභාව විසින් අයකර ගත යුතුය. සමාලෝචිත වර්ෂයේදී ඉඩම් වෙන්දේසිවලින් රු.511,963 ක මුදලක් අයකර ගත යුතුව තිබුණද රු.61,220 ක් පමණක් අයකර ගෙන තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,716,017ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,475,444ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුල පිළිවෙලින්රු.6,516,067ක් හා රු.16,525,439ක් වූ මූලධන ආධාර හා රු.7,026,741ක් හා රු.17,462,157ක් වූ මූලධන වියදම් ගණන් ගැනීමෙන් පසු එකී අතිරික්තය පිළිවෙලින් රු.14,205,343ක් හා රු.5,538,726ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 8,666,617ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල තත්‍ය ආදායම, වියදම හා අදාල විචලනයන් පහත දැක්වේ.

| | ආදායම | | | | වියදම | | |
|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | 2015 | 2014 | විචලනය | වියදම් විෂයය | 2015 | 2014 | විචලනය |
| | රු000. | රු000. | රු000. | | රු000. | රු000. | රු000. |
| (i) උත්පාදිත ආදායම | 14,080 | 13,829 | 251 | පෞද්ගලික පඩිනඩි | 38,807 | 29,314 | 9,493 |
| (ii) වෙනත් | 53,118 | 35,550 | 17,568 | අනෙකුත් | 13,675 | 13,589 | 86 |
| උප එකතුව | 67,198 | 49,379 | 17,819 | උප එකතුව | 52,482 | 42,903 | 9,579 |
| (iii) ප්‍රාග්ධන ආදායම | 6,516 | 16,525 | (10,009) | ප්‍රාග්ධන වියදම | 7,027 | 17,462 | (10,435) |
| මුළු එකතුව | 73,714 | 65,904 | 7,810 | මුළු එකතුව | 59,509 | 60,365 | (856) |
| මූල්‍ය ප්‍රතිඵලය | 14,716 | 6,476 | 8,240 | අතිරික්තය | 14,205 | 5,539 | 8,666 |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.67,198,407 න් දළ වශයෙන් සියයට 79 ක් වූ රු.53,117,935 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි ලැබීම්වලින් සමන්විත විය.එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.6,516,067 ක මුළු ප්‍රමාණයම වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල්වලින් සමන්විත විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.52,482,390 න් දළ වශයෙන් සියයට 74 ක් වූ රු.38,806,863 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම විය.

(ඈ) ප්‍රාග්ධන වියදම වූ රු.7,026,740 ක මුළු ප්‍රමාණයම ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීම, පළාත් ආයෝජන වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදනවලින් සිදුකළ සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයයන් | අයවැයගත | තථ්‍ය ලැබීම් | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | අයවැයගත | තථ්‍ය ලැබීම් | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රු000. | රු000. | රු000. | රු000. | රු000. | රු000. |
| (අ) | වරිපනම් හා බදු | 1,586 | 1,943 | 357 | 1,272 | 1,813 | 6,023 |
| (ආ) | බදු කුලී | 9,925 | 8,309 | 1,616 | 10,000 | 8,431 | 129 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 606 | 691 | 85 | 1,090 | 642 | - |
| (ඇ) | වෙනත් ආදායම් | 51,389 | 56,255 | 4,866 | 46,932 | 38,490 | 19,998 |
| | | 63,506 | 67,198 | 6,924 | 59,294 | 49,376 | 26,150 |

## 2.3.2 බිල්කල ආදායමෙන් රැස්කල ආදායම

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ආදායම් බිල් කිරීම,ආදායම් රැස් කිරීම හා හිඟහිටි ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ශීර්ෂය | ආදායම් බිල් කිරීම | | | ආදායම් රැස් කිරීම | | | | හිඟ හිටි ආදායම | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015.01.01 දිනට හිඟ | 2015 වර්ෂයේ බිල් කිරීම් | එකතුව | හිඟයෙන් රැස් කල | බිල්කිරීමෙන් රැස් කල | ඉදිරිවර්ෂය සඳහා ලැබු මුදල | එකතුව | 2015.01.01 හිඟයෙන් ඉතිරි | බිල්කල ආදායමෙන් හිඟ හිටි | 2015.12.31 හිඟය (එකතුව) |
| | රු. | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 260,631 | 763,380 | 1,024,011 | 97,865 | 692,299 | 93,315 | 883,479 | 162,766 | 71,081 | 233,847 |
| අක්කරබදු | 342,699 | 42,595 | 385,294 | 19,804 | 7,629 | 4,272 | 31,705 | 322,894 | 34,966 | 357,860 |
| බදුකුලි | 112,555 | 1,998,194 | 2,110,749 | - | 1,290,296 | 8,850 | 1,299,146 | 112,555 | 707,898 | 820,453 |
| කඩකුලි | 177,400 | 421,800 | 599,200 | 6,400 | 412,400 | - | 418,800 | 171,000 | 9,400 | 180,400 |
| මුද්දරගාස්තු | 21,044,863 | 8,000,000 | 29,044,863 | 3,190,991 | - | - | 3,190,991 | 17,853,872 | 8,000,000 | 25,853,872 |
| උසාවිදඩ | 2,106,627 | 4,054,484 | 6,161,111 | 2,106,627 | 153,834 | - | 2,260,461 | - | 3,900,650 | 3,900,650 |
| බලපත්‍රගාස්තු | - | 320,850 | 320,850 | - | 320,850 | - | 320,850 | - | - | - |
| ජලගාස්තු | 134,029 | 134,390 | 268,419 | 118,184 | 104,565 | 330 | 223,079 | 15,845 | 29,825 | 45,670 |
| වෙනත් | - | 11,490,621 | 11,490,621 | - | 11,490,621 | - | 11,490,621 | - | - | - |
| එකතුව | 24,178,804 | 27,226,314 | 51,405,118 | 5,539,871 | 14,472,494 | 106,767 | 20,119,132 | 18,638,932 | 12,753,820 | 31,392,752 |

(අ) 2014 වර්ෂයේ වරිපනම් බදු රු.260,631 ක හිඟ ශේෂයක් පැවති අතර එයින් සමාලෝචිත වර්ෂය තුල රැස්කර තිබුනේ රු.97,865 ක් හෙවත් හිඟ වරිපනම් බදු වලින් සියයට 37 ක් පමණි.

(ආ) 2014 වර්ෂයේ රු.342,699 ක හිඟ අක්කර බදු ශේෂයක් පැවති අතර එයින් සමාලෝචිත වර්ෂය තුල රැස්කර තිබුනේ රු.19,804 ක් හෙවත් හිඟ අක්කර බදු ශේෂයෙන් සියයට 06 ක් පමණි.

(ඇ) 2014 වර්ෂයේ රු.112,555 ක හිඟ බදුකුලී ශේෂයක් පැවති අතර එයින් සමාලෝචිත වර්ෂය තුල කිසිදු මුදලක් අයකර නොතිබුණි.

(ඈ) 2014 වර්ෂයේ රු.177,400 ක හිඟ කඩකුලී ශේෂයක් පැවති අතර එයින් සමාලෝචිත වර්ෂය තුල රැස්කර තිබුනේ රු 6,400 ක් හෙවත් හිඟ කඩ කුලී ශේෂයෙන් සියයට 4 ක් පමණි.

### 2.3.3 බදු කුලී

(අ) අවම ලංසු රු.454,020 ක්වූ වත්කම් 18 ක් 2015 වර්ෂය සඳහා බදු දීමට නොහැකි වීමෙන් සභාවට පාඩුවක් සිදුවී තිබුණි.

(ආ) 2011 අගෝස්තු 24 දින විධිමත් ගිවිසුමක් මගින් බදු දී තිබුණ දූම්මලසූරිය පොදු වෙළඳපොල අංක 01 කඩ කාමරයේ 2012 ජනවාරි සිට වෙනත් පුද්ගලයෙකු අනවසරයෙන් පදිංචි වී සිටීම හේතුවෙන් නීත්‍යානුකූල බදුකරු විසින් 2012 ජනවාරි සිට බදු කුලී ගෙවා නොතිබුණි.2001 වර්ෂයේදී බදුගත් පුද්ගලයා බදු ඔප්පුවක් මගින් වෙනත් අයෙකුට පැවරීම අනවසර පදිංචියට හේතුවී තිබුණ බව අනාවරණය වූ අතර, මෙලෙස ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව උප බදු දීම නීත්‍යානුකූලව නිරාකරණය නොකර 2011 වර්ෂයේදී කුලී ගිවිසුමකට එළඹීම මත මෙම අර්බුදකාරී තත්ත්වය උද්ගතවී තිබුණි. ඒ අනුව 2016 මැයි 03 දින වන විට අයවීමට තිබුණු බදු මුදලේ වටිනාකම රු.212,850 ක් විය.

### 2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ මුදල් රු.3,900,650 ක් වූ අතර, මුද්දර ගාස්තු රු.25,853,872 ක් විය. 2016 මාර්තු 31 දිනය වන විට ලැබිය යුතු ශේෂයන් පිළිවෙලින් රු.3,716,982 ක් හා රු.13,500,000 ක්ද වී තිබුණි.

### 2.3.5 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

2015 වර්ෂය වන විට සභා බල ප්‍රදේශය තුල දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 09 ක් ස්ථාපිත කර තිබූ බව හඳුනාගෙන තිබුණද මෙම කුළුණු සඳහා අදාල ගාස්තු ගෙවා සංවර්ධන බලපත්‍ර ලබාගෙන නොතිබුණි. මෙම කුළුණු මගින් සන්නිවේදන පහසුකම් සපයා තිබුණු ආයතන අනුව වාර්ෂික වෙළඳ හා බලපත්‍ර ගාස්තුද අයකර නොතිබුණි.

### 2.3.6 ඉඩම් කට්ටිකර විකිණීමෙන් ලත් සියයට 1 බදු මුදල්

මහ ලක්ෂ්මී වතුයාය Iඉඩම හා දඹගහමුලහේන අක්කර 02 ඉඩම කට්ටිකර විකිණීම වෙනුවෙන් සභාවට අයවිය යුතු අවම බදු ආදායමින් පිළිවෙලින් රු.65,250 ක් සහ රු.85,284 ක් වශයෙන් රු.150,534 ක් අඩුවෙන් අයකර ගෙන තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ සේවය කල සේවකයින් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන් සභාව වෙත පනවා තිබූ රු.156,791 ක අධිභාර මුදලින් රු.69,000 ක් අදාල නිලධාරිනියන්ගෙන් අයකර තිබූ අතර තවදුරටත් අයවිය යුතු ශේෂය රු.87,791 ක් විය.

(ආ) සේවක භාරකාර අරමුදලේ දායක මුදල් ප්‍රමාද කිරීම මත සභාව වෙත එම අරමුදල විසින් රු.22,469 ක් අධිභාර පනවා තිබූ අතර වගකිව යුතු නිලධාරීන්ගෙන් රු.5,000 ක මුදලක් අය කරගෙන තිබුණි.

(ඇ) පුරනැගුම ප්‍රතිපාදන මඟින් ඉදිකර 2015 සැප්තැම්බර් 11 දින සභාවට භාර දෙනු ලැබූ තට්ටු 03 කින් යුතු බහුකාර්යය ගොඩනැගිල්ල විගණිත දිනය වූ 2016 ජුලි 01 දින වන විටද නිෂ්කාර්යව පැවතුණි. මෙම ගොඩනැගිල්ල දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්, ආයුර්වේද මධ්‍යස්ථානයක් සායන මධ්‍යස්ථානයක් වැනි පොදු කටයුතු සඳහා භාවිතා කිරීමට උපදෙස් ලැබී තිබුණ ද එවැනි පොදු කටයුතු සඳහා යොදා ගෙන නොතිබුණි.

(ඈ) අංක PB-4861 දරන වෑන් රථය අළුත්වැඩියා කිරීමෙන් තොරව 2015 පෙබරවාරි මස සිට විගණිත දිනය වූ 2016 ජුලි 01 දින වන විටත් වර්ෂයකට වැඩි කාලයක් තිස්සේ නිෂ්කාර්යව ගාල් කර තිබුණි.

(ඉ) සභාව සතු අංක RS-1220 දරන JCB යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා වැලිවේරිය පුද්ගලික ආයතනයකට 2015 දෙසැම්බර් 07 දින යොමුකර තිබුණද, විගණිත දිනය වූ 2016 ජුලි 01 දින වන විටත් අළුත්වැඩියා කර නොතිබුණි.

(ඊ) රු.1,004,062 ක් වැය කර 2011 වර්ෂයේ ආරම්භ කර තිබුණු කුට්ටිගල් නිෂ්පාදන ව්‍යාපෘතිය 2012 වර්ෂයේ සිටම ප්‍රමාණවත් ප්‍රතිලාභ ලබා කර ගැනීමට අපොහොසත් වී තිබුණි. 2015 වර්ෂයේ ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රු.52,448 ක් වැය කර තිබුණු අතර, බ්ලොක් ගල් 573 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි.

(උ) සභාව සඳහා ආදායම් මූල්‍ය හා තොග කළමනාකරණ මෘදුකාංග පද්ධතිය හඳුන්වා දීම සඳහා පරිගණක මෘදුකාංග සැපයුම් ආයතනයත් සමඟ රු.850,000 ක මුදලකට 2012 අගෝස්තු 20 දින ගිවිසුම් අත්සන් කර ගිවිසුම් මුදලින් රු.412,778 ක් අදාල ආයතනයට ගෙවා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව වසරක කාලයක් පමණක් නොමිලේ සේවා පහසුකම් ලබාදෙන බව සඳහන් කර තිබුණද සේවා ගිවිසුම අවසන් වන දිනය ගිවිසුමේ සඳහන් කර නොතිබුණි. ඉහත මෘදුකාංග පද්ධතියට අදාල රු.850,000 කට අමතරව පරිගණක ජාලගත කිරීම, සර්වර් යන්ත්‍රය මිලට ගැනීම, පරිගණක හා UPS යන්ත්‍රය මිලදී ගැනීම වෙනුවෙන් රු.1,241,838 ක මුදලක් වැය කර තිබුණද, අදාල වැඩ සටහන විගණිත දිනය වූ 2016 ජුලි 01 දින වන විටත් ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි.

(ඌ) 2015 නොවැම්බර් 12 දින සිදුකරන ලද භෞතික ගබඩා පරීක්ෂාවේදී ගබඩාව තුල භාවිතය සඳහා නිකුත් කිරීමට ඇති ද්‍රව්‍ය සහ අබලි ද්‍රව්‍ය විධිමත් ලෙස ගබඩා කර නොතිබුණි. සභා භූමියේ ජල බැස්ම ගබඩාව දෙසට යොමුවී තිබුණු බැවින් වැසි ජලය ගබඩාව තුලට ගලා ඒමට ඉඩකඩ තිබුණි. තවද 2013 ජුලි 07 දින පළාත් පාලන අමාත්‍යාංශය පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ජංගම බහුකාර්ය කුටි 10 ක් 2015 ජනවාරි සිට නිෂ්කාර්යව පැවතුණි.

(එ) 2014 නොවැම්බර් 28 දින බිංගිරිය ප්‍රාදේශීය සභාවෙන් ලැබී මන්ත්‍රීවරුන් වෙත බෙදා හැර තිබුණු කොඩි කණු 117 ක් සභාව වෙත ආපසු භාරදී නොතිබුණු අතර, එම කොඩි කණු සභාවේ ලේඛනවලද ඇතුලත් කර නොතිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| විධායක | 02 | 02 | - | - |
| ද්විතියික | 39 | 31 | 10 | 02 |
| ප්‍රාථමික | 50 | 54 | 05 | 09 |
| වෙනත් (පුහුණු) | - | 03 | - | 03 |
| | 91 | 90 | 15 | 14 |

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**4.1 අභ්‍යන්තර විගණනය**

ආයතනය තුළ ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය